භාෂාව සහ ඒ ඔස්සේ ජනසමාජයේ චින්තනය හැඩගැසීම අප නිතර නිතර සංවාදයට බඳුන් කරමු. විශේෂයෙන්ම ලෝක ව්‍යාප්ත වසංගත තත්වයක් සමගින් කටයුතු කරමින් සිටිනා අතරතුරදී පුවත්, මාධ්‍ය මගින් ඊට අදාළව සිදුකරනා වාර්තාකරණයන් සඳහා යොදාගන්නා භාෂාව, කොවිඩ්-19 පිළිබඳ සමාජයේ අදහස් හැඩගැස්වීම කෙරෙහි බලපවත්වන බව කිව යුතුවේ.

මේ සඳහා උදාහරණයක් ලෙසින්, මේ දිනවල සිරස්තල තුළ භාවිතා වෙනු දැකිය හැකි "කොරෝනා කත" වැනි යෙදුම් දැක්විය හැක. යම් අයෙකු හට මෙම වෛරසය ආසාදනය වීම හා රෝගය වැළඳීම කිසිසේත්ම එම පුද්ගලයාගේ වරදක් නොවේ. එනමුත් 'කොරෝනා කත' වැනි යෙදුම් ඔස්සේ සිදුවන්නේ කොවිඩ්-19 රෝගීන් සහ නිරෝධායනය කොට සිටින්නන් සමාජය තුළ කොන් කිරීමකට ලක් වීම නොවේද? එසේම ඒ ඔස්සේ මෙම වසංගත තත්වය මර්දනය කිරීමේ කටයුතු වලට පවා බාධාවක් සිදුනොවන්නේද? ඒ අනුව මෙවන් යෙදුම් වෙනුවට "කොවිඩ් වැළඳුණු කාන්තාව" වඩාත් යෝග්‍ය යෙදුම් භාවිතය යහපත් නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Divaina**